රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 63/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1989 දෙසැම්බර් මස 17 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

1990 අයවැය යෝජනා අනුව ගෙවනු ලබන
රු.200/= මාසික දීමනාව

ඒකාබද්ධ වැටුප් ක්‍රමයත ආරම්භක පියවර මාසිකව රු.2000/= ට අඩු රජයේ සියලු සේවකයින්ට දැනට ගෙවනු ලබන ස්ථාවර ජීවන වියදම් දීමනාවට අමතරව 1990 ජනවාරි මස 01 දින සිට රු.200/= ක මාසික දීමනාවක් ගෙවිය යුතු වේ. මේ දීමනාව මාසිකව රු.2000/= ට අඩු ආරම්භක වැටුපක් හිමි තාවකාලික හා අනියම් පදනම මත සේවය කරන සියලු සේවකයින්ටද, රු.2000/= ට අඩු මාසික විශ්‍රාම වැටුපක් ලබන විශ්‍රාමිකයන්ටද ගෙවිය යුතු වේ.

02. මෙම පදනම මත විශ්‍රාමිකයින්ට මෙම දීමනාව ගෙවීම පිළිබඳව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ක්‍රියා කරනු ඇත.

03. 1990 අයවැය ඇස්තමේන්තුවල ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා වෙන්කොට ඇති ප්‍රතිපාදන සහ වෙනත් පුනරාවර්තන වැය විෂයන්හි ඉතිරිකිරීම් වේ නම් ඒද විරමෝං ක්‍රියා පටිපාටිය අනුව උපයෝගී කර ගනිමින් වැය විෂය සංකේත 01 (8) යටතේ මෙම වියදම් දැරිය යුතු අතර, මේ සඳහා අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වේ නම්, එම මුදල් ප්‍රමාණය ගණන් බලන ආකාරය පැහැදිලිව දක්වමින් අයවැය අධ්‍යක්ෂ වෙතින් අමතර ප්‍රතිපාදන ලබාගැනීමට ක්‍රියා කළයුතු වේ.

04. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

(පී.එච්.එම්.ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

පු/-26